**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය - 2013**

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩල පනතේ 33(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූපව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.2 ඡේදය ප්‍රකාරව සියළුම රාජ්‍ය ව්‍යවසායන් විසින් සියළු ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාවලින් ආවරණය වන පරිදි ස්වකීය පද්ධති අත්පොත් පිළියෙල කළ යුතු වුවත් මණ්ඩලය විසින් එවැනි පද්ධති හා අත්පොත් පිලියෙළ කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය කාර්යසාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ලැබුණු රජයේ ප්‍රදාන (ගලපන ලද) පිළිබඳ විස්තර හා සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ දරන ලද පුනරාවර්තන වියදම සහ ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදානයේ වැඩිවීම් ප්‍රතිශතයක් ලෙස පහත දැක්වේ.

| විෂයය | 2013 වර්ෂය | 2012 වර්ෂය | පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩිවීම | වැඩිවීම පසුගිය වර්ෂයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| රජයේ ප්‍රදාන | 55,215,000 | 37,409,000 | 17,806,000 | 47 |
| මුළු පුනරාවර්ථන වියදම් | 56,365,201 | 41,914,896 | 14,450,305 | 34 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය පිහිටුවා තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු ප්‍රගති වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙක තුළ කාර්යාසාධනය පිළිබඳ පහත සඳහන් මණ්ඩලය විසින් සාක්ෂාත් කර ගෙන තිබුණි.

| | 2013 | 2012 | 2011 |
|---|---|---|---|
| වර්ෂය තුල ලැබුණු වාර්ෂික වාර්තා සංඛ්‍යාව | 1,322 | 1,443 | 1,716 |
| සමාලෝචනය කරන ලද වාර්ෂික වාර්තා සංඛ්‍යාව | 751 | 302 | 213 |
| සමාලෝචනය සඳහා ලැබුණු වාර්තා සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස සමාලෝචනය කරන ලද වාර්ෂික වාර්තා සංඛ්‍යාව | 57 | 21 | 12 |

| | | | |
|---|---|---|---|
| සමාලෝචනය සඳහා සහභාගී වූ තාක්ෂණික නිලධාරීන් සංඛ්‍යාව | 14 | 6 | 6 |
| වර්ෂය තුල එක් තාක්ෂණික නිලධාරියෙකු විසින් සමාලෝචනය කරන ලද මූල්‍ය වාර්තා සංඛ්‍යාව | 58 | 50 | 35.5 |

2011, 2012 සහ 2013 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරිම සඳහා බාහිර පාර්ශවල (සමාලෝචකයන්) සහාය ලබා ගෙන තිබුණි. මෙම වර්ෂවල සමාලෝචනය කරන ලද වාර්ෂික වාර්තා සංඛ්‍යාව පිළිවෙලින් 213 , 302 හා 751 ක් විය. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ඉහත සේවය ලබා ගැනීම සඳහා පිළිවෙලින් රු. 1,970,000 ක් හා රු.2,490,000 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ එක් වාර්තාවක් සමාලෝචනය කිරීම සඳහා සාමාන්‍ය පිරිවැය පිළිවෙලින් රු. 2,623 ක් හා රු.8,425 ක් විය. සමාලෝචිත වර්ෂයේදි අභ්‍යන්තර සමාලෝචකයින් බඳවා ගැනීම මෙම හිතකර විචලනයට හේතු වී තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

මණ්ඩලයේ අන්තර්ජාල වෙබ් අඩවිය වැඩිදියුණු කිරිම සඳහා සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් රු. 1,250,000 ක් හා රු. 850,000 ප්‍රතිපාදනය කර තිබුණද එම ඉලක්කය ඉටු කර ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

### 4.3 පනත සංශෝධනය කිරිම

මණ්ඩලය වෙත සමාලෝචනය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන භාර නොදෙන ආයතනවලින් දඩ මුදල් අය කර ගැනීම සඳහා විධිවිධාන සැලසීමට මණ්ඩලයට හැකිවන පරිදි මණ්ඩලයේ පනත සංශෝධනය කිරිම සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණ නමුත් 2014 ජුනි 30 දින දක්වා පනත සංශෝධනය කිරිම සඳහා මණ්ඩලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුත්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන සංයුක්ත සැලැස්මේ පිටපතක් වර්ෂය ආරම්භයට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ වුවද, එම සැලැස්ම මාස 03 ක ප්‍රමාදයකින් පසුව 2013 මාර්තු 21 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 5.1.2 පරිච්ඡේදය ප්‍රකාර පහත සඳහන් තොරතුරු සංයුක්ත සැලැස්ම මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(i) මණ්ඩලයේ වර්තමාන සම්පත් යටතේ මානව සම්පත් හා කළමනාකරණ හැකියාවන් පිලිබඳ තොරතුරු

(ii) 2012 වර්ෂයට අදාල තොරතුරු හා ඉකුත් වර්ෂ 03 කට අදාළ මෙහෙයුම් ප්‍රතිඵල

### 5.2 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් වාර්ෂික අයවැය ලේඛනය අනුමත කර මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද අයවැය ලේඛනය 2013 අප්‍රේල් 08 දින මාස 03 ක ප්‍රමාදයකින් පසුව විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 ඡේදයේ දක්වා ඇති පහත සඳහන් තොරතුරු 2013 වර්ෂය සඳහා අයවැය ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(i) වර්ෂය සඳහා අයවැයගත ආදායම

(ii) වර්ෂය සඳහා අයවැයගත ශේෂ පත්‍රය

(iii) වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(ඇ) අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කලමණාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර මණ්ඩලයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) සේවක පරිපාලනය

(ආ) අයවැය පාලනය

(ඇ) සුළු මුදල් කළමනාකරණය